කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 අප්‍රේල්/ මැයි/ ජූනි**

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය - MACO - E 3015**

**මාධ්‍ය ආචාරධර්ම, මහජන සම්බන්ධතාව හා දැන්වීම් කලාව**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "මහජන සම්බන්ධතාව යනු අලෙවිකරණය හෝ දැන්වීම්කරණය හෝ නොවේ." මහජන සම්බන්ධතාව යන සංකල්පය පැහැදිලි කරන්න.

02. මහජන සම්බන්ධතා මූලික ප්‍රභේද, ඒවා ක්‍රියාත්මක කරන නූතන නව මාධ්‍ය ක්‍රම ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. මහජන සම්බන්ධතාව සහ ප්‍රචාරණය යන අංශ දෙකෙහි ඉතිහාසය සහ ඒවා වර්ධනය වූ ආකාරය එකිනෙකට වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

04. තෝරා ගන්නා ලද නිෂ්පාදනයක් හෝ සේවාවක් හෝ ආයතනයක් හෝ ගෙන, ඒ සඳහා උචිත මහජන සම්බන්ධතා සැලසුමක් නිර්මාණය කරන්න.

05. වත්මන් මාධ්‍ය ආචාරධර්ම, ප්‍රාථමික මානව ජන සමාජයේ තිබූ "තහංචි ක්‍රම" ඔස්සේ ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය විස්තර කරන්න.

06. "වාරණය යනු දේශපාලන උපකරණයක් පමණක් නොවේ." වාරණයේ ප්‍රභේද අතර පවතින වෙනස්කම් දක්වන්න.

07. මාධ්‍ය නීතිය හා මාධ්‍ය ආචාරධර්ම අතර පවතින වෙනස්කම් සසඳන්න.

08. පහත සඳහන් ප්‍රකාශ දෙකෙන් එකක් පිළිබඳ ස්වයං විවරණයක යෙදෙන්න.

**එක්කෝ**

A. "ප්‍රකාශන නිදහස, මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය .......... යනාදිය ආසියානු කලාපයේ රටවල අවගමනයට හේතු වී ඇත."

**නැතහොත්**

B. "ප්‍රකාශන නිදහස යනු කිසිදු ප්‍රායෝගික වටිනාකමක් නොමැති කෙස් පැළෙන තර්කයනට පමණක් හසුවන සංකල්පයක් පමණි."

********************************